# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

| පාලි භාෂාව | 4 වසර | කාලය පැය 3 යි |
|---|---|---|

* 1, 2, 3 ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(1) i. වර්ගාන්ත අකුරු නම් කරන්න.

ii. බාහිර සන්ධියට හා අභ්‍යන්තර සන්ධියට නිදසුන් සපයන්න.

iii. තතියා විභක්ත්‍යර්ථ දෙකක් සඳහා නිදසුන් සපයන්න.

iv. කම්මධාරය සමාසයේ ප්‍රභේද 4ක් නම් කරන්න.

v. ආඛ්‍යාතය හඳුන්වන්න.

vi. රසවාහිනියේ කර්තෘ හා කාලය දක්වන්න.

vii. ජිනචරිතයේ දැක්වෙන පරිදි සිදුහත් කුමරු උපන් අවස්ථාවේ සිදුවූ අසිරිමත් සිදුවීම් 4ක් ලියන්න.

viii. රසවාහිනියේ දැක්වෙන ඔබ උගත් දානානිසංස ප්‍රකට කෙරෙන කථාවස්තු 2ක් නම් කරන්න.

ix. මිත්‍රද්‍රෝහී නොවීමේ ආනිසංස 4ක් දක්වන්න.

x. බුදුරජාණන් වහන්සේ හැඳින්වීමට අභිධානප්පදීපිකාවේ දැක්වෙන නම් 08ක් ලියන්න.

(ලකුණු 4×10=40)

(2) සිංහලට නගන්න.

(අ) අථා'පරස්මිං සමයේ ලංකාය බ්‍රාහ්මණතියං චෝරභයං අහෝසි. තදා ද්වාදස සංවච්ඡරං මේඝෝ න සම්මා පාවස්සි. දුබ්භික්ඛභයඤ්ච චෝරභයඤ්ච අහෝසි. තතෝ විහාරාසන්නේසු මනුස්සා ජීවිතුං අසක්කොන්තා අඤ්ඤත්‍ර ගන්ත්වාජීවිතං කප්පෙස්සාමාති ථේරමුපසංකම්ම එවමහංසු. භන්තේ ඡාතකභයමුප්පන්නං න සක්කාම එත්ථ වසන්තේහි ජීවිතුං. තුම්හේ ආගච්ඡථා'ති යාචිංසු. (අභයත්ථේරස්ස වත්ථු)

(ලකුණු 10)

(ආ) සිංහලට නගන්න.

තේසං කරා රතිකරා අජිනප්පවේණී
මාදාය තේනමුපගම්ම පටිග්ගහේසුං
දේවා දුකූලමයචුම්බටකේන වීරං
තේසං කරා නරවරා නරසීහරාජං
තේසං කරා රතිකරෝ විමලෝ'ව චන්දෝ
චක්කංකිතෝරුචරණේහි මහීතලස්මිං
සම්මා පතිට්ඨිය පුරත්ථිමකං දිසං සෝ
ඕලෝකයිත්ථ කමලායතලෝචනේහි

(ජිනචරිතය 92,93)

(ලකුණු 10 )

(ඇ) පහත ගාථා පාඨ සම්පූර්ණ කරන්න.

i. අන්තකෝ වසවත්තී ච.......

ii. මේඝෝ වලාහකෝ දේවෝ......... (අභිදානප්පදීපිකා 49,53) (ලකුණු 05)

(ඉ) i. ධූමෝ පුමෝ (ච) ධමනේ .........

ii. අයෝ වයෝ පය - මයෝ .......... (ධාතුමඤ්ජුසා 56,57) (ලකුණු 05 )

(3 ) (අ) පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. ගුත පිණ්ඩං ගහෙත්වා චන්දමණ්ඩලං දූසේතුං වායමන්තීව පරිස මජ්ඣෙ තථාගතං අක්කෝසි.

ii. තේසං අන්තරේ මේලමාතා නාම ඒළිකා ව්‍යක්තා අහෝසි උපාය කුසලා.

iii. සචේ සෝ කුමාරෝ අගාරේ අජ්ඣාවසිස්සා චක්කවත්ති රාජා අභවිස්සා.

iv. පේමතෝ ජායතී සෝකෝ පේමතෝ ජායතී භයං.

v. සීහල දීපේ කිර මහාතලාක විහාරං නාම අහෝසි.

(ආ) පහත වාක්‍ය පාලියට පරිවර්තනය කරන්න.

i. ඒ සියඹලා විකුණන කෙල්ල තෙමසක් ගිය පසු කඩමාලුවලින් බඩ වෙළුවාය.

ii. ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන්වහන්සේට එසේය ස්වාමීනී'යි පිළිවදන් දුන්හ.

iii. ඔබ කීකරු අයෙක් වන්නේ නම් මැනවි.

iv. යමෙක් දුර වෙසෙත් යමෙක් ළඟ වෙසෙත් ඒ සියලු සත්වයෝ සැපවත් වෙත්වා.

v. කාමයන්හි බැඳුම දුරු කරන්නේ නම් මව් කුසක සයනයට නැවත නොඑයි.

(ලකුණු 10 )

(4) i. පුරුෂ ලිංග ගෝ ශබ්දය හෝ ස්ත්‍රී ලිංග කඤ්ඤා ශබ්දය සියලු විභක්ති වල වරනගන්න.

ii. ගමු ධාතුව භවිස්සන්ති ආඛ්‍යාතයේ උභය පදයේ වර නගන්න. (ලකුණු 10 )

(5) i. සමාස හඳුන්වා ද්වන්ද සමාසයට නිදසුන් සපයන්න.

ii. උපසර්ග හඳුන්වා ඒවායේ කාර්ය භාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 )

(6) i. කිතක යනු මොනවා ද ?

ii. කිතක කාල අනුව නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10 )

(7) සාර්ථක භික්ෂු ජීවිතයකට රසවාහිනී කථා මගින් ලබා ගත හැකි ආදර්ශ අභිමත කථා 2ක් ඇසුරින් උපුටා දක්වන්න. (ලකුණු 10 )

(8) ජිනචරිතයේ එන හිමවත වර්ණනාව සැකෙවින් දක්වන්න (ලකුණු 10 )